# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුව

ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු රැස්වීම් ශාලාව

2020.09.29 දින

පෙ.ව. 10.30 ට

| | | |
|---|---|---|
| 01 | පිළිගැනීම සහ අරමුණු පැහැදිලි කිරීම | - ඌව පළාතේ ප්‍රධාන ලේකම් (පළාත් විගණන හා කළමනාකරණ කමිටු සභාපති) |
| 02<br><br>03. i<br><br>03. ii<br><br>03. iii | පසුගිය රැස්වීම් වාර්ථාව ඉදිරිපත් කිරීම හා ආයතන මට්ටමින් සිදු කළ විගණන හා කළමනාකරණ කමිටු පිළිබඳව හා පළාත් අභ්‍යන්තර විගණනයේ කරුණු ඉදිරිපත් කිරීම.<br><br>අටවෙනි පාර්ලිමේන්තුවේ සිවුවෙනි සැසිවාරයේ පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 116 හි පළකරන ලද රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවෙහි සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.<br><br>ප්‍රාදේශීය කාර්යාල වෙත බලතල පවරා දී ඇති පළාත් සභා කාර්යයන් සම්බන්ධව සමාලෝචන කටයුතු කිරීම. (2020.09.03 දිනැති ලිපිය)<br><br>ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ පළාත් සභා ප්‍රඥප්ති පිළිබඳව ගැටළු සාකච්ඡා කිරීම. | - ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ (විගණන හා කළමනාකරණ කමිටු කැඳවුම්කරු) |
| 04 | අමාත්‍යාංශ මට්ටමේ කරුණු ඉදිරිපත් කිරීම<br><br>I. ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br>II. ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය<br>III. ඌව පළාත් මාර්ග අමාත්‍යාංශය<br>IV. ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය<br>V. ඌව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය | <br><br>- ලේකම්<br>- ලේකම්<br>- ලේකම්<br>- ලේකම්<br>- ලේකම් |

| | | |
|---|---|---|
| **05** | අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතන වල කරුණු ඉදිරිපත් කිරීම.<br><br>I. ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය<br>II. ඌව පළාත් සභා ලේකම් කාර්යාලය<br>III. ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>IV. ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | <br><br><br>- ආණ්ඩුකාරවර ලේකම්<br>- සභා ලේකම්<br>- ලේකම්<br>- ලේකම් |
| **06** | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල මට්ටමින් කරුණු ඉදිරිපත් කිරීම්<br><br>I. පළාත් සභා ඉදිකිරීම් කටයුතු වල ගුණාත්මකභාවය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග<br><br>II. පළාත් සභා අරමුදල, ගිණුම් ඉදිරිපත් කිරීම්, වියදම් පාලනය හා වත්කම් පරිපාලනය<br><br>III. කරුණු ඉදිරිපත් කිරීම<br><br>IV. කරුණු ඉදිරිපත් කිරීම<br><br>V. කරුණු ඉදිරිපත් කිරීම | <br><br><br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)<br><br><br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)<br><br><br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | |
|---|---|---|
| 07 | ජාතික විගණන ආයතනයේ අදහස් දැක්වීම් | - විගණන අධිකාරී (මොණරාගල)<br>- විගණන අධිකාරී (ඌව පළාත් සභාව)<br>- විගණන අධිකාරී (බදුල්ල)<br>- විගණන අධිකාරී (පළාත් පාලන) |
| 08 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම් | - අධ්‍යක්ෂ ජනරාල්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය) |
| 09 | අදහස් දැක්වීම් | - සහකාර විගණකාධිපති (ඌව) |
| 10 | අදහස් දැක්වීම් | - ඌව පළාත් ප්‍රධාන ලේකම් (පළාත් විගණන හා කළමනාකරණ සභාපති) |
| 11 | රැස්වීම් අවසානය | |

ඌව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සහ විගණන හා කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්තුමන්, සියලුම ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ගණකාධිකාරීවරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන් සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන ලදී. එසේම කළමනාකරණ සහයක ක්‍රියාවලියක් ලෙසට මෙම විගණන කටයුතු සහ විගණන කළමනාකරණ කටයුතු සිදු කිරීමට හැකිවිය. ඒ සඳහා ජාතික විගණන ආයතනය නියෝජනය කරන සහකාර විගණකාධිපතිතුමන් ඇතුළු විගණන අධිකාරීවරුන් සහ මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවද නොමඳ සහයක් ලබාදෙන ලදී. මේ සම්බන්ධව ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වශයෙන් ගෞරව පූර්වක ස්තූතිය පළකර සිටිමි.

# විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වීම

- ජාතික විගණන පනතේ **41 (1)** වගන්තියේ විධිවිධාන
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධාන
- උසව පළාතේ ප්‍රධාන ලේකම්තුමාගේ චක්‍රලේඛ උපදෙස් හා විධිවිධාන
- උසව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් හා නියෝග
- ජාතික විගණන ආයතනයේ උපදෙස් හා මඟපෙන්වීම්

# විගණන හා කළමනාකරණ කමිටුවල සාකච්ඡා කල කරුණු

**01.** අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ගැනීම සහ අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳව අනුමැතිය ලබාදීම, ජාතික විගණන පනතේ 40 (1) වගන්තියට අනුව ආයතන මට්ටමින් අභ්‍යන්තර විගණකවරු පත් කර විගණන කටයුතු සිදු කිරීම.

**02.** සේවක මණ්ඩල කළමනාකරණ සහ කාර්ය සාධනය පිළිබඳ සාකච්ඡා කිරීම.

**03.** මූල්‍ය පාලනය, මූල්‍ය වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.

**04.** වත්කම් ආරක්ෂාව සහ වත්කම් පරිපාලනය සහ වාර්තා කිරීම සහ සම්පත් සකසුරුවම් ලෙස භාවිතා කිරීම.

**05.** ආයතන අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුම් මෙන්ම එහි ප්‍රගතිය, තිරසර අරමුණු සපුරා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීම.

**06.** මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(1) හා ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ අංක 10/2010 සහ 4/2012 අනුව උපදෙස් ලබාදී ඇති අනෙකුත් කරුණු

# විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම

- පිහිටුවා ඇති විගණන කමිටු සංඛ්‍යාව - 84

**පසුගිය වර්ෂ 05 සිට මේ දක්වා විගණන කමිටු ක්‍රියාත්මක වීම**

| වර්ෂය | පවත්වා ඇති කමිටු රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| 2015 | 115 |
| 2016 | 130 |
| 2017 | 157 |
| 2018 | 225 |
| 2019 | 213 |
| 2020 මේ දක්වා | 121 |

# 2020 වර්ෂයේ මේ දක්වා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම්

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **01.** පළාත් අමාත්‍යංශ | | | | |
| 1 | **1.** ක්‍රීඩා අමාත්‍යංශය | 2020.03.11 | | 2020.08.19 | |
| | | | | 2020.09.22 | |
| 2 | **2.**කෘෂිකර්ම අමාත්‍යංශය | 2020.02.25 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 3 | **3.**මාර්ග අමාත්‍යංශය | 2020.02.26 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 4 | **4.** අධ්‍යාපන අමාත්‍යංශය | | | 2020.07.09 | |
| | | | | 2020.09.23 | |
| 5 | **5.**සෞඛ්‍ය අමාත්‍යංශය | 2020.02.27 | | 2020.07.31 | |
| | | | | 2020.09.23 | |
| | **02.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල | | | | |
| 6 | **1.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | 2020.02.25 | | 2020.09.11 | |
| 7 | **2.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය | | | | |
| 8 | **3.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය | 2020.02.26 | | 2020.09.22 | |
| 9 | **4.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | | | 2020.08.26 | |
| 10 | **5.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය | | | | |
| | **03.** අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් | | | | |
| 11 | **1.** ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය | | | 2020.08.19 | |
| 12 | **2.** ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 2020.03.04 | | 2020.08.13 | |
| 13 | **3.** ඌව පළාතේ සභා ලේකම් කාර්යාලය | | | 2020.09.23 | |
| 14 | **4.** ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | | | 2020.08.13 | |
| | **04.** පළාත් දෙපාර්තමේන්තු | | | | |
| 15 | **1.**අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2020.02.28 | | 2020.08.25 | |
| | | | | 2020.09.23 | |
| 16 | **2.**ආදායම් දෙපාර්තමේන්තුව | | | 2020.07.09 | |
| | | | | 2020.09.23 | |
| 17 | **3.**ආයුර්වේද දෙපාර්තමේන්තුව | 2020.02.27 | | 2020.07.31 | |
| | | | | 2020.09.23 | |

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| 18 | **4.**ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | | | 2020.07.09 | |
| | | | | 2020.09.23 | |
| 19 | **5.**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | | | |
| 20 | **6.**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | | 2020.07.09 | |
| | | | | 2020.09.23 | |
| 21 | **7.**කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 2020.03.11 | | 2020.08.19 | |
| | | | | 2020.09.22 | |
| 22 | **8.**අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | | 2020.09.22 | |
| 23 | **9.**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2020.02.25 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 24 | **10.**මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | 2020.02.26 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 25 | **11.**පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2020.03.10 | | | |
| 26 | **12.**පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව | 2020.02.27 | | 2020.07.31 | |
| | | | | 2020.09.23 | |
| 27 | **13.**සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 2020.02.26 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 28 | **14.**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 2020.02.26 | | 2020.07.31 | |
| | | | | 2020.09.23 | |
| 29 | **15.**සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | 2020.02.25 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 30 | **16.**සමාජ සේවා දෙපාර්තමේන්තුව | 2020.02.27 | | 2020.07.31 | |
| | | | | 2020.09.23 | |
| 31 | **17.**වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2020.02.25 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 32 | **18.** ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 2020.03.11 | | 2020.08.19 | |
| | | | | 2020.09.22 | |
| | | | | | |
| | **05.** ආයතන (වෙනත්) | | | | |
| 33 | **1.**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- මොණරාගල | 2020.02.27 | | 2020.07.31 | |
| | | | | 2020.09.23 | |
| 34 | **2.**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- බදුල්ල | 2020.02.27 | | 2020.07.31 | |
| | | | | 2020.09.23 | |
| 35 | **3.**පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය (කහගොල්ල) | | | | |
| 36 | **4.**පැල්ගහතැන්න කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය | | | | |

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| 37 | **5.**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය-බදුල්ල | 2020.02.27 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 38 | **6.**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය-මොණරාගල | 2020.02.27 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 39 | **7.**පුස්තකාල සේවා මණ්ඩලය | | | 2020.07.09 | |
| | | | | 2020.09.23 | |
| | **06.**මූලික රෝහල් | | | | |
| 40 | **1.**දියතලාව | | | | |
| 41 | **2.**මහියංගනය | | | | |
| 42 | **3.**වැලිමඩ | | | | |
| 43 | **4.**සියඹලාණ්ඩුව | | | | |
| 44 | **5.**බිබිල | | | | |
| 45 | **6.**වැල්ලවාය | | | | |
| | **07.**කලාප අධ්‍යාපන කාර්යාල | | | | |
| 46 | **1.**බදුල්ල | 2020.01.28 | | 2020.08.25 | |
| 47 | **2.**බණ්ඩාරවෙල | 2020.01.28 | | 2020.08.25 | |
| 48 | **3.**බිබිල | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| 49 | **4.**මහියංගන | 2020.01.28 | | 2020.08.25 | |
| 50 | **5.**පස්සර | 2020.01.28 | | 2020.08.25 | |
| 51 | **6.**වැලිමඩ | 2020.01.28 | | 2020.08.25 | |
| 52 | **7.**වැල්ලවාය | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| 53 | **8.**මොණරාගල | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| 54 | **9.**වියලුව | 2020.01.28 | | 2020.08.25 | |
| 55 | **10.**තණමල්විල | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| | **08.**නගර සභා | | | | |
| 56 | **1.**බදුල්ල | | | 2020.07.31 | |
| 57 | **2.**බණ්ඩාරවෙල | | | | |
| 58 | **3.**හපුතලේ | | | | |

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **09.**ප්‍රාදේශිය සභා | | | | |
| 59 | **1.**බදුල්ල | | | | |
| 60 | **2.**බඩල්කුඹුර | | | 2020.08.27 | |
| 61 | **3.**බණ්ඩාරවෙල | | | | |
| 62 | **4.**බිබිල | | | 2020.08.27 | |
| 63 | **5.**බුත්තල | | | 2020.08.27 | |
| 64 | **6.**ඇල්ල | | | | |
| 65 | **7.**හල්දුම්මුල්ල | | | | |
| 66 | **8.**හාලිඇල | | | | |
| 67 | **9.**හපුතලේ | | | | |
| 68 | **10.** කන්දකැටිය | | | | |
| 69 | **11.**කතරගම | 2020.01.31 | | 2020.08.27 | |
| 70 | **12.**ලුණුගල | | | | |
| 71 | **13.**මඩුල්ල | | | 2020.08.27 | |
| 72 | **14.**මහියංගනය | | | | |
| 73 | **15.**මැදගම | | | 2020.08.27 | |
| 74 | **16.**මීගහකිවුල | | | | |
| 75 | **17.**මොණරාගල | 2020.02.20 | | 2020.08.27 | |
| 76 | **18.**පස්සර | | | | |
| 77 | **19.**රිදීමාලියද්ද | | | | |
| 78 | **20.**සියඹලාණ්ඩුව | | | 2020.08.27 | |
| 79 | **21.**සොරණාතොට | | | | |
| 80 | **22.**තණමල්විල | | | 2020.08.27 | |
| 81 | **23.**ඌව පරණගම | | | | |
| 82 | **24.**වැල්ලවාය | 2020.02.27 | | 2020.08.27 | |
| 83 | **25.**වැලිමඩ | | | | |
| | | | | | |
| 84 | **01.** පළාත් විගණන හා කළමනාකරණ කමිටුව | | | | |

# පසුගිය වර්ෂ කිහිපය තුළ අභ්‍යන්තර විගණනයේ ක්‍රියාත්මක වීම

| වර්ෂය | සිදුකළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| 2015 | 210 |
| 2016 | 251 |
| 2017 | 352 |
| 2018 | 313 |
| 2019 | 334 |
| 2020 මෙ දක්වා | 104 |
| එකතුව | 1564 |

# විගණන වාර්තා ඉදිරිපත් කිරීම - 2020

## (2020.09.28 දිනට)

| ආයතනය | ඉදිරිපත් කල විගණන විමසුම් සංඛ්‍යාව |
|---|---|
| ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | 36 |
| ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 12 |
| ඌව පළාත් මාර්ග අමාත්‍යාංශය | 05 |
| ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 10 |
| ඌව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය | 04 |
| අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතන | 04 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල | 04 |
| එකතුව | 79 |

# නියමිත දිනට විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමෙන් අත් කර ගත් ප්‍රතිලාභ

**01.** නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කිරීම සහ සැලකිය යුතු ගිණුම් සංඛ්‍යාවක් වෙනුවෙන් යහපත් විගණන මතයක් ලබා ගැනීම.

**02.** පළාත් සභා ආයතන 1100 පමණ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට සිදු කර අවසන් කිරීම.

**03.** සියලුම ආයතන වල වත්කම් පරිපාලන කටයුතු විධිමත් පරිදි සිදු කිරීම. (මේ සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් මඟ පෙන්වීම් සිදු කරන ලදී)

**04.** ආයතන කාර්ය සාධනය වැඩි දියුණු කර ගැනීම.

**05.** අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩසටහන් සඳහා දායකත්වයක් ලබා ගැනීම.

## 06. මූල්‍ය විචක්ෂණතාවය පවත්වා ගනිමින් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ඇගයීමට පත් වීම.

| ආයතනයන් | | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| | | සම්මාන කුසලතා | සම්මාන කුසලතා | සම්මාන කුසලතා |
| ඌව පළාතේ සහා ලේකම් කාර්යාලය | | - | - | ✓ |
| ඌව පළාතේ ප්‍රධාන ලේකම් යටතේ පවතින ආයතන | මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව | ✓ | - | ✓ |
| | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | - | ✓ | ✓ |
| | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | - | ✓ | ✓ |
| | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය | - | - | ✓ |
| | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | ✓ | ✓ | ✓ |
| ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය | ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | - | - | ✓ |
| | පළාත් පාලන දෙපාර්තමේන්තුව (ඌව) | - | - | ✓ |
| | ප්‍රාදේශීය සභාව මැදගම | ✓ | - | - |
| | ප්‍රාදේශීය සභාව හපුතලේ | ✓ | ✓ | - |
| | ප්‍රාදේශීය සභාව මොණරාගල | - | ✓ | - |
| | ප්‍රාදේශීය සභාව ඇල්ල | - | ✓ | ✓ |
| | මහ නගර සභාව බණ්ඩාරවෙල | - | - | ✓ |

| ආයතනයන් | | 2016 සම්මාන කුසලතා | 2017 සම්මාන කුසලතා | 2018 සම්මාන කුසලතා |
|---|---|---|---|---|
| උෟව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය | උෟව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | ✓ | - | - |
| | පරිවාස දෙපාර්තමේන්තුව | - | ✓ | - |
| | සමාජ සේවා දෙපාර්තමේන්තුව | ✓ | ✓ | - |
| මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමූපකාර කටයුතු අමාත්‍යාංශය | උෟව පළාත් මාර්ග අමාත්‍යාංශය | - | ✓ | ✓ |
| | සමූපකාර දෙපාර්තමේන්තුව | - | ✓ | - |
| | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | - | - | ✓ |
| උෟව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිශ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ✓ | ✓ | - |

# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳ කමිටු කටයුතු 2019.12.12 දින

**2019.12.12 දින ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, සහකාර විගණකාධිපති (ඌව), විගණන අධිකාරීවරුන්ගේ (බදුල්ල/ මොණරාගල) සහභාගීත්වයෙන් පළාත් අරමුදල් පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.**



# එහිදී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී.

## 1. ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### 01.1 ඌව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තුවට අදාළව සිදු කරන වාරි ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධව විගණනය විසින් සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂාව අනුව නියමිත ප්‍රතිලාභ නොලැබීම සහ කර්මාන්තය ආරම්භ කිරීමට අදාළ සාධ්‍යතා වාර්තා වල අඩුපාඩු සහිත බවත් සාකච්ඡා කරන ලදී. එසේම,

i. කර්මාන්ත නිසි පරිදි සම්පූර්ණ කර නොතිබීම.
ii. ඉදිකිරීම් දුර්වලතා
iii. ඇල මාර්ග නඩත්තු නොකිරීම.

වැනි අඩුපාඩුකම් පහත සඳහන් කර්මාන්ත වල පැවති බවත් ඉදිරියේදී ඒවා යථාතත්ත්වයට පත්කර ගොවි ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ලබාදීමට පියවර ගන්නා බවත් අදාළ දෙපාර්තමේන්තු කරුණු ඉදිරිපත් කිරීමේදී එකඟවන ලදී.

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| වැලිමඩ මහ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම (2017) | **5,300,000.00** | නඩත්තු නොකිරීම හා වාරිමාර්ග පද්ධතිය අවහිර කර තිබීම | 1. අදාළ ගොවි සංවිධාන දැනුවත් කර ඇල මාර්ග නඩත්තු කිරීමට පියවර ගැනීම.<br>2. ඉදිරියේදී කර්මාන්ත අධීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>3. කර්මාන්ත ඉටු කිරීම නිසා ඇතිවී තිබෙන ගොවි ගැටලු කඩිනමින් විසඳාලීම.<br>4. අදාළ ව්‍යාපෘති මඟින් ගොවීන් සඳහා ප්‍රතිලාභ ලැබී ඇති බවට පසු විපරම් වාර්තා තබාගැනීම හා ඉදිරි පළාත් කමිටුව වෙත ඉදිරිපත් කිරීම.<br>5. අදාළ ගොවි සංවිධාන දැනුවත් කර කර්මාන්ත නිසි පරිදි නඩත්තු කිරීමට පියවර ගැනීම.<br>6. මහජන ප්‍රවේශ අවශ්‍යතා සඳහා ඇස්තමේන්තු සකස් කර අදාළ කර්මාන්ත සම්පූර්ණ කිරීම. | **1.** අමාත්‍යාංශ ලේකම්<br>**2.** පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ |
| තෙලබාවල වැල්ලවත්ත අමුණ හා ඇල මාර්ග ප්‍රතිසංස්කරණය ඌවපරණගම (2019) | **1,750,000.00** | ලොග් සටහන් පොතක් කර්මාන්ත භූමිය තුල නිරීක්ෂණය නොවීම නිසා ලබාදුන් කාර්මික උපදෙස් පිළිබඳව තොරතුරු තහවුරු නොවීම හේතුවෙන් ඉදිකිරීම් වල අඩුපාඩු නිරීක්ෂණය වීම. | | |
| දරගල මහතැන්න ඇල ප්‍රතිසංස්කරණය (2019) | **1,884,000.00** | ඇල දෙපස පස් පිරවීමක් සිදු නොකිරිම නිසා කර්මාන්තයේ පැවැත්ම පිළිබඳ ගැටළු සහගත බවක් නිරීක්ෂණය වීම සහ ඇස්තමේන්තු සඳහා එවැනි අයිතමයක් ඇතුළත් නොවීම. | | |

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල බුදුන් අරාව උඩපේරුව | **2,524,000.00** | ඉදිකිරීම් අතරමග අතහැර දැමීම | 1. අදාළ ගොවි සංවිධාන දැනුවත් කර ඇල මාර්ග නඩත්තු කිරීමට පියවර ගැනීම.<br>2. ඉදිරියේදී කර්මාන්ත අධීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>3. කර්මාන්ත ඉටු කිරීම නිසා ඇතිවී තිබෙන ගොවි ගැටලු කඩිනමින් විසඳාලීම.<br>4. අදාළ ව්‍යාපෘති මඟින් ගොවීන් සඳහා ප්‍රතිලාභ ලැබී ඇති බවට පසු විපරම් වාර්තා තබාගැනීම හා ඉදිරි පළාත් කමිටුව වෙත ඉදිරිපත් කිරීම.<br>5. අදාළ ගොවි සංවිධාන දැනුවත් කර කර්මාන්ත නිසි පරිදි නඩත්තු කිරීමට පියවර ගැනීම.<br>6. මහජන ප්‍රවේශ අවශ්‍යතා සඳහා ඇස්තමේන්තු සකස් කර අදාළ කර්මාන්ත සම්පූර්ණ කිරීම. | **1.** අමාත්‍යාංශ ලේකම්<br>**2.** පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ |
| හොරියගොල්ල ඇල ප්‍රතිසංස්කරණය කිරීම (2019) | **3,111,000.00** | මීට පෙර සිදු කර ඇති ඇල මාර්ග අළුත්වැඩියාවේ පැවති ඉදිකිරීම් අඩුපාඩු මෙන්ම නිසි පරිදි නඩත්තු නොකිරීම මත මෙම කර්මාන්තයේ බලාපොරොත්තු වන ප්‍රතිලාභ ගොවීන් වෙත ලබා ගැනීමේ අපහසුතා නිරීක්ෂණය වීම. | | |
| ගෝනගන්ආර පැලැස්ස පෝෂිත ඇල ප්‍රතිසංස්කරණය කිරීම (2019) | **1,900,000.00** | මෙම පෝෂිත ඇල සකස් කිරීම නිසා ගොවීන්ගේ ඉඩම් ඇල මාර්ග වෙනුවෙන් එකඟ වූ ප්‍රමාණයට වඩා විශාල වශයෙන් වගා කල හැකි පෞද්ගලික ඉඩම් ලබා ගැනීම නිසා ගොවීන් අසීරුතාවයට පත්වීම සහ නිවාස සහ ඉඩකඩම් වලට ප්‍රවේශ වීමට නොහැකි වීම. | | |

## 01.2 නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මොණරාගල

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| ගොවීන් ද්‍රව්‍ය බෙදා දීම. | - | **2018/ 2019** වර්ෂ වලදී මිලදී ගත් ගොවීන් හට බෙදා දීමට නියමිතව තිබූ ද්‍රව්‍ය ගබඩාවේ රැදී පැවතීම.<br><br>පොලිසැක් බෑග් **-3910**<br>ඇල්කතීන් බට අඟල් **1-6800** අඩි<br>කමත් අතුරන **-22**<br>ඉලෙක්ට්‍රික් තරාදි **-07**<br>සේනා දළඹු උගුල් **-200** | 1. මෙම ද්‍රව්‍ය කඩිනමින් අදාළ ගොවීන් වෙත බෙදා දීමට තීරණය කරන ලදී. අදාළ ගබඩා කෙටි කාලයකින් නැවත පරික්ෂා කිරීමට විගණන අංශය දැනුවත් කරන ලදී. | 1. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ<br>2. නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මොණරාගල) |

## 2. ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| විවිධ ව්‍යාපෘති මඟින් පාසල් ගොඩනැගිලි සහ වැසිකිලි කැසිකිළි ඉදිකර අවසන්ව ඇතත් සිසු අයිතියට පත් කිරීම සහ ප්‍රයෝජනයට නොගැනීම | - | විවිධ ව්‍යාපෘති මඟින් පාසල් ගොඩනැගිලි සහ වැසිකිලි කැසිකිළි ඉදිකර අවසන්ව ඇතත් සිසු අයිතියට පත් කිරීම සහ ප්‍රයෝජනයට නොගැනීම මත නිසි නඩත්තුවක් නොමැති කමින් විනාශ වී යාම<br>උදා -<br>මො/ කොවුල්ආරගම ප්‍රාථමික විද්‍යාලය - සෙවනගල<br>i. මො/ බිබිලමුල්ල කණිෂ්ඨ විද්‍යාලය<br>ii. බ/ සොරගුණේ මහා විද්‍යාලය<br>iii. බ/ රන්වන්ගුහාව විදුහල | 1. අදාළ පාසල් වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීම හා සමස්ථ ක්ෂේත්‍රයේ වැඩ නිම වී ඇති ගොඩනැගිලි භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.<br>2. ඉදිකිරීම් අඩුපාඩු අදාළ කොන්ත්‍රාත්කරුවන් මඟින් සකස් කිරීමට පියවර ගැනීම හා අතරැඳවුම් මුදල් නිදහස් නොකිරීම. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br>3. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) |
| පාසල් අධීක්ෂණය | - | පළාත් දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල මඟින් සිදු කරන පාසල් අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත් නොවීම. එසේම සමස්ථ ක්ෂේත්‍රයේ ආයතන පරිපාලන හා මූල්‍ය පරිපාලන දුර්වලතා මතුවීම, පසු විපරම් වැඩසටහන් ක්‍රියාත්මක නොවීම. | පාසල් අධීක්ෂණය නිසි පරිදි සැලසුම් කර පරිපාලන කටයුතු, මූල්‍ය කටයුතු මෙන්ම වත්කම් පරිපාලනය, පාසල් සෞඛ්‍ය මෙන්ම පරිසරය පිළිබඳව අවධානය යොමු කිරීම මෙන්ම පසු විපරම් කිරීමේ කටයුතුද සිදු කල යුතු වීම. මේ පිළිබඳව රාජ්‍ය විගණනය මඟින් සිදු කළ විශේෂ අදහස් දැක්වීමට අනුව කටයුතු කිරීමද සිදු කල යුතු බව තීරණය විය. | 1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br>2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු<br>3.කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු |

## 02.1 පළාත් පාලන දෙපාර්තමේන්තුව (ඌව)

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| අනවසර ඉදිකිරීම් | - | 1. පළාත් පාලන ආයතන බල සීමාවේ සිදුවන අනවසර ඉදිකිරීම් නිසා විශාල වශයෙන් පරිසර හානි සිදුවීම මෙන්ම නගර අලංකරණය සම්බන්ධ ගැටළු මතුවීම.<br>2. ආයතන සීමාවේ සිටින ජනතාව අපහසුතාවලට ලක්වීම. | පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කර අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සහ ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීමේදී සැලසුම් කමිටු ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | 1. පළාත් පාලන කොමසාරිස්<br>2. පළාත් පාලන ආයතන ප්‍රධානීන් |
| ගිවිසුම් ගතවීම් | - | 1. ගිවිසුම් පත්‍රය අංග සම්පූර්ණ නොවීම<br>2. ගිවිසුම් පත්‍රයේ ඇති අඩුපාඩු<br>3. වර්තමානයට ගැලපෙන ලෙස ගිවිසුම් පත්‍ර සකස් නොවීම<br>4. නීතිමය කටයුතු සඳහා ඇති බාධාවන්<br>5. දේපළ බැහැර කිරීම්<br>6. මුදල් අයකිරීම් සම්බන්ධව ගිවිසුම් වල සඳහන් වන තොරතුරු වල අඩුපාඩු<br><br>වැනි තත්ත්වයන් මත දේපළ සහ ඉඩම් බදු දීමේදී සැලකිය යුතු හිඟ ආදායම් පළාත් පාලන ආයතන වල දක්නට ලැබීම. | මෙ සම්බන්ධව ඌව පළාත් සභා නීති ඒකකයේ සහය ලබාගෙන අංග සම්පූර්ණ ගිවිසුමක් සකස් කිරීමට පියවර ගත යුතු බව සාකච්ඡා විය. | 1. පළාත් පාලන කොමසාරිස්<br>2. පළාත් පාලන ආයතන ප්‍රධානීන්<br>3. ගිවිසුම්කරුවන් |

## 02.1 පළාත් පාලන දෙපාර්තමේන්තුව (ඌව)

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| හිඟ ආදායම් | රු. මිලියන 310 | අදාළ පළාත් පාලන ආයතන වල ආදායම් පරිපාලනයේ දුර්වලතා මත වරිපනම්, කඩකුලී, බලපත්‍ර ලබාගැනීම් වෙනුවෙන් සැලකිය යුතු හිඟ ආදායම් ගිණුම් අනුව නිරීක්ෂණය වීම. | මෙ සම්බන්ධව සියලුම පළාත් පාලන ආයතන ආවරණය වනසේ විශේෂ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, ආදායම් පරීක්ෂක/ පරිපාලනවරුන් සඳහා ආදායම් අයකිරීම් ඉලක්ක ලබාදීම. | 1. පළාත් පාලන කොමසාරිස්<br>2. පළාත් පාලන ආයතන ප්‍රධානීන්<br>3. කොමසාරිස්වරු/ ලේකම්වරු |

# 3. ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| ඇඟිලි සලකුණු යන්ත්‍රය සවිකිරීම. | - | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව සෞඛ්‍ය ආයතන මට්ටමින් නිලධාරීන්ගේ හා සේවකයින්ගේ රාජකාරියට වාර්තා කිරීම, පිටවීම සම්බන්ධයෙන් සැලකිය යුතු පළාත් සභා අරමුදල් වැය කර ලබාදී ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම නිසා නිශ්කාර්යය වියදමක් මෙන්ම වත්කම් බවට පැවතීම. | නොයෙකුත් හේතූන් මත ජාතික මට්ටමින් හඳුන්වා දී ඇති ක්‍රමවේදයක් නිසාත් වෘත්තීය විශේෂ වරප්‍රසාද නිසාත් සෞඛ්‍ය කාර්ය මණ්ඩල වල විවිධ ක්ෂේත්‍රයන් මේ සඳහා අනුගත වීම සිදු නොකරයි. නමුත් අදාළ ආයතන වල හැකි මට්ටමින් මේ සඳහා අනුගත කරවා ගැනීමේ වගකීම ආයතන ප්‍රධානියා සතු වේ. ඒ අනුව කටයුතු කල යුතුය. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන්<br>3. විෂයභාර නිලධාරීන් |

## 3. ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| ඖෂධ පරිපාලනය හා උපකරණ භාවිතයට ගැනීම | - | 1. සැලකිය යුතු පිරිවැයක් අපතේ යන සහ කල් ඉකුත් වූ ඖෂධ සම්බන්ධයෙන් වැය වීම.<br><br>1. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආයතන මට්ටම් වල නිශ්කාර්යව පවතින උපකරණ සහ ද්‍රව්‍ය පිළිබඳව වාර්තා වීම.<br><br>උදා -<br>i. Autoclave යන්ත්‍ර 27 -6317000.00<br>ii. Dental x ray (සියඹලාණ්ඩුව රෝහල) -500000.00<br>iii. Incinarator (සියඹලාණ්ඩුව, බිබිල)<br>iv. Spot lamp<br>v. Portable blood analyzer -10674968.00<br>vi. Urine analyzer -1694000.00<br>vii. Mortuary cooler -2900,000.00<br>viii. සියඹලාණ්ඩුව රෝහලේ මෘත ශරීරාගාරය නිශ්කාර්යයව පැවතීම. | 1. මේ සඳහා අදාළ දෙපාර්තමේන්තුව සම්බන්ධ කර අමාත්‍යාංශ මට්ටමේ අධීක්ෂණය මත කල් ඉකුත් වූ ඖෂධ සම්බන්ධව කටයුතු කිරීම හා උපකරණ අවශ්‍යතා මත කඩිනමින් භාවිතා කිරීමට කටයුතු කිරීම. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන්<br>3. විෂයභාර නිලධාරීන්<br>4. ඖෂධ ගබඩා පරීක්ෂකවරුන් සහ නිලධාරීන් |

මොනරාගල

# රුපියල් ලක්ෂ 70ක් වටිනා එක්ස්රේ යන්ත්‍රය මාස 8ක් කොරිඩෝවේ

## මුදල් නැති නිසා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නොහැකි වුණා

### වෛද්‍ය අධිකාරී ආර්.එම්.ඩී. රත්නායක



**බිබිල - නලුන් ගුණතිලක**

මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලට ජනවාරි මාසයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ලබාදුන් එක්ස්රේ යන්ත්‍රය තවමත් තිබෙන්නේ රෝහලේ කොරිඩෝවේය.

එක්ස්රේ යන්ත්‍රය සවිකිරීමට අවශ්‍ය පහසුකම් සහිත කාමරයක් නොතිබීම නිසා කොරිඩෝවේ තබා ඇතැයි දැනගන්නට ඇත.

මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍ය අධිකාරී ආර්.එම්.ඩී. රත්නායක මහතාගෙන් කළ විමසුමකදී මෙසේ කීය.

"මෙම වසර තුළදී රෝහලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා එක්ස්රේ යන්ත්‍රය තැබීමට සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නොහැකි වුණා.

ඒ නිසා එක්ස්රේ යන්ත්‍රය ආරක්ෂිතව රෝහල් කොරිඩෝවේ තබා තිබෙනවා. දැනට රෝහල සතුව එක්ස්රේ යන්ත්‍ර දෙකක් තිබෙන නිසා කඩිනමින් එක්ස්රේ යන්ත්‍රය සවිකිරීමේ අවශ්‍යතාවක් පෙනෙන්නට නැහැ.

මූල්‍ය ප්‍රතිපාදන ලැබුණු වහාම සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකොට එක්ස්රේ යන්ත්‍රය ස්ථාපිත කිරීමට පියවර ගන්නවා."

**3. ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය**

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
| --- | --- | --- | --- | --- |
| මල අපවහන පද්ධති | - | සියඹලාණ්ඩුව මූලික රෝහල් අප ජලය නිසි පරිදි බැහැර නොවීම සහ හැඩ ඔයට එකතුවීමේ අවධානම් තත්ත්වයක් පැවතීම. | | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන්<br>3. පළාත් පාලන නිලධාරීන්<br>4. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් |

# 4. ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශය

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| මාර්ග සංවර්ධන ක්ෂේත්‍රය | - | 1. ජල ව්‍යාපෘති සඳහා මාර්ග දෙපස කඩතොළු කිරීම නිසා සිදුවූ හානිදායක තත්ත්වයන් නිරීක්ෂණය වීම.<br>2. පෙරමුසු යොදා මාර්ග අළුත්වැඩියාව සම්බන්ධව පැවති ක්‍රමවේදයේ අඩුපාඩු සහිත බැවින් මෙන්ම පෙරමුසු අවශ්‍ය නොවන මාර්ග කොටස් සඳහාද වියදම් දැරීම.<br>3. අයිරෝඩ් ව්‍යපෘතිය ක්‍රියාත්මක වීමට තොරා ගත් මාර්ග නිසි පරිදි නඩත්තු නොවීම නිසා සිදුවී ඇති ගමනාගමන අපහසුතා | 1. අදාළ මාර්ග ආරක්ෂා කර ගැනීම සඳහා පියවර ගැනීම මෙන්ම මාර්ග දෙපස කැණීම් සිදු කරන ආයතන වලින්නැවත සකස් කිරීමට වැයවන වියදම් සඳහා තැන්පත් මුදල් ලබා ගැනීම.<br>2. පෙරමුසු යොදා මාර්ග නඩත්තු කිරීමේදී අවශ්‍ය ස්ථාන සඳහා පමණක් ඇස්තමේන්තු කිරීමට කාර්මික නිලධාරීන් දැනුවත් කිරීම. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන්තු ප්‍රධානී<br>3. ප්‍රාදේශීය ඉංජිනේරු (මාර්ග) |

## 04.1 ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| සමුපකාර අරමුදල | රු. මිලියන 131 | 1. සමුපකාර අරමුදල වෙනුවෙන් අදාළ සමුපකාර සමිති විසින් සැලකිය යුතු හිඟ මුදලක් ගෙවීමට තිබීම. | අදාළ සමිති දැනුවත් කර කොටස් වශයෙන් හෝ අදාළ හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගැනීම, මුදල් නොගෙවන සමිති වෙනුවෙන් නීතිමය පියවර ගැනීම. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන්තු ප්‍රධානී<br>3. සමුපකාර නිලධාරීන් |

## 5. ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්ත මේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| ක්‍රීඩා උපකරණ | රු. මිලියන 6 | ක්‍රීඩා උපකරණ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන් සතුව පවතී. මෙම උපකරණ සහ ද්‍රව්‍ය භාණ්ඩ සමීක්ෂණ අවස්ථාවලදී ලේඛන ගත කිරීම සහ භෞතිකව පරීක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම. | ක්‍රීඩා සමිති සංගම්වලට අදාළව පළාත් අරමුදලින් වියදම් දරන ලබා දී ඇති සැලකිය යුතු වටිනාකමක් ගන්නා උපකරණ සහ ද්‍රව්‍ය, භාණ්ඩ සමීක්ෂණ අවස්ථාවලදී ලේඛන ගත කිරීම සහ භෞතිකව පරීක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසීම. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන් තු ප්‍රධානී<br>3. දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන් |

## 05.1 සංචාරක අංශය

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| සංචාරක සුවපහසු මධ්‍යස්ථාන | රු. මිලියන 130 | ඉදි කළ සංචාරක සුවපහසු මධ්‍යස්ථාන ක්‍රියාකාරී මට්ටමින් නොපැවතීම. | මෙම ස්ථාන ක්‍රියාකාරී මට්ටමින් පවත්වා ගැනීම සහ විකල්ප ක්‍රියාමාර්ග ගැනීම. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන්තු ප්‍රධානී |

## 05.2 ඌව පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය

| අවධානය යොමු කල ක්ෂේත්‍රයන් | ඇස්තමේන්තු මුදල | විගණනය විසින් පෙන්වා දුන් තත්ත්වයන් | පළාත් කමිටුවේ තීරණ | අවධානය යොමු කළ යුතු නිලධාරීන් |
|---|---|---|---|---|
| ආයතන සහ මූල්‍ය පරිපාලනය | රු. මිලියන 6.2 | සේවක මණ්ඩල පරිපාලනය, මූල්‍ය පරිපාලනය සහ ආදායම් අයකර ගැනීමේ අඩුපාඩු නිසා අධිකාරියේ මූල්‍ය ශක්තිය අවම වීම. | අධීක්ෂණ කටයුතු පුළුල් කිරීම හා හිඟ ආදායම් අයකර ගැනීම මෙන්ම ආදායම් කළමනාකරණය කිරීම. | 1. අමාත්‍යාංශ ලේකම්<br>2. දෙපාර්තමේන්තු ප්‍රධානී<br>3. සභාපති<br>4. සාමාන්‍යාධිකාරී |

## 1. ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

i. ආණ්ඩුකාරවර අරමුදලේ කාර්යභාරය වැඩි දියුණු කිරිම සහ ආණ්ඩුකාරවර අරමුදල ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යාම.
ii. මෙම අරමුදලේ ප්‍රතිලාභ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් දියුණු කිරීම.

## 2. ඌව පළාතේ සභා ලේකම් කාර්යාලය

i. ගිණුම් කාරක සභා නිර්දේශ ක්‍රියාවට නැංවීම සහ පසුවිපරම් කිරීමේ කටයුතු.
ii. විගණකාධිපති වාර්තා සභාගත කිරීම සම්බන්ධ කටයුතු

## 3. ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

i. විමර්ශන නිලධාරී සංචිත ඇතිකිරීමේ වැදගත්කම
ii. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන ලිපිගොණු සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම.

## 4. ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

i. සමුපකාර සේවකයින් පුහුණු කිරීම.

## 5. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය

i. පළාත් සභා පළාත් නීති ඒකකයේ කටයුතු වැඩි දියුණු කිරීම සහ ගිවිසුම් ගතවීම් ඇතුළු පළාත් පාලන ආයතන නෛතික කටයුතු වලදී අදාළ අවශ්‍ය සහය ලබාදීම සම්බන්ධව අවධානය යොමු කිරීම.

## 6. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

i. කාර්ය මණ්ඩල තොරතුරු විධිමත්ව පවත්වාගෙන යාම සහ නිලධාරීන් පුහුණු කිරීම සම්බන්ධව මෙන්ම අදාළ පුහුණුව පළාත් රාජ්‍ය සේවයේ විෂයයන්ගේ ප්‍රවර්ධනයට හේතුවී තිබේදැයි පසු විපරම් කිරීම.

## 7. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය

i. පළාත් අරමුදල ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන ගැනීම.
ii. වත්කම් කළමනාකරණය සහ පළාත් සභා පරිපාලනයට අයත් ආයතන වල මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදු කිරීම සහ නියමිත පරිදි ගිණුම් සහ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය සහය ලබාදීම.

## 8. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

i. ළඟම පාසල හොඳම පාසල ඇතුළු පළාත තුළ සිදුවන ඉදිකිරීම් සම්බන්ධව නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහ ලොග්පොත් පවත්වාගෙන යාම ආදී කර්මාන්ත අධීක්ෂණ කටයුතු සම්බන්ධව ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීම.

# අටවෙනි පාර්ලිමේන්තුවේ සිවුවෙනි සැසිවාරයේ පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 116 හි පළකරන ලද රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවෙහි සඳහන් නිරීක්ෂණ.

I. කාර්ය මණ්ඩලයට අදාළව මානව සම්පත් (සංවර්ධන) සැලැස්මක් සකස් කර නොතිබීම සහ ක්‍රියාත්මක නොවීම.

II. මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන නොයාම සහ යාවත්කාලීන නොවීම.

III. ඉල්ලා සිටින තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත නොකිරීම සහ ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොගැනීම.

IV. අභ්‍යන්තර/ බාහිර විගණන විමසුම් නියමිත කාලය තුළ ප්‍රතිචාර ඉදිරිපත් කර නොතිබීම.

V. විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම.

VI. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම.

VII. රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද පිළිබඳව නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීම.

VIII. CIGAS වැඩ සටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් නොකිරීම.

IX. සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හා ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනට පෙර අනුමත කරවාගෙන නොතිබීම.

X. වාර්ෂික කාර්ය සාධන වාර්තා නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් නොකිරීම.

XI. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන නොයාම.

XII. පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම.

XIII. වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව, අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබීම.

XIV. තත්කාර්යය අතුරු අග්‍රිම කාර්ය නිම වී මසක් ඇතුළත නිරවුල් නොකිරීම.

XV. අබලි/ ගර්හිත වාහන නියමිත කාල සීමාව තුළ අපහරණය නොකර පැවතීම.

XVI. වාහනවල ඉන්ධන දහනය වීම සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදු කිරීම.

XVII. පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.

XVIII. වර්ෂයකට වැඩි කලක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ පැවතීම.

XIX. බැංකු සැසඳීමේ ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල, මාස 6 ක කාලය ඉක්මවූ චෙක්පත් තිබීම.

XX. දීර්ඝ කාලීනව/ වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපලවලට අදාළ බදු මුදල් හිඟ සිටුවීම.

XXI. කසල කළමනාකරණයට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවීම.

# ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ පළාත් සභා ප්‍රඥප්ති පිළිබඳව ගැටළු සාකච්ඡා කිරීම.

I. **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පළාත් සභාවට පැවරී ඇති 09 වන උප ලේඛනය හෙවත් පළාත් සභා ලැයිස්තුවේ විෂය ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු නොකිරීම.**

II. **අදාළ අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරනු ලබන ප්‍රඥප්ති සකස් කිරීමේදී එම ප්‍රඥප්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල වන්නේද යන්න නීති ආයතනවලින් තහවුරු කර නොගැනීම.**

III. **දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලට පරිවර්තනය කිරීමේදී භාෂාවන් අතර විවිධ අර්ථ ගැන්වීම් පැවතීම.**

IV. **ප්‍රඥප්ති කෙටුම්පත සම්බන්ධයෙන් අදාළ විෂයභාර ගරු අමාත්‍යවරයා නිසි පරිදි දැනුවත් කර නොතිබීම.**

V. **නීතිපති හෝ නීතිමය උපදෙස් නිසි පරිදි ලබා නොගැනීම.**

VI. **කඩිනමින් ඉදිරිපත් කර සම්මත කිරීමට උත්සහ දැරීම තුළ ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ට හෝ යෝජිත ව්‍යවස්ථා පිළිබඳ කාරක සභාවට අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම හා අඩුපාඩු හෝ සංශෝධනයන් ලබාදීමට අවකාශ නොලැබීම වැනි අවස්ථා මඟ හරවා ගැනීම සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් අවම වශයෙන් මාස 02 කට පෙර මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.**

VII. **ප්‍රඥප්තියක් සම්මත කළ පසු සංශෝධනය කිරීමේ ක්‍රමවේදය සංකීර්ණ වීම හේතුවෙන් සම්මත කරන ලද්දේ දෝෂ සහිත ප්‍රඥප්තියක් වුවහොත් එකී ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ බාධා ඇති වීම හා ගන්නා ලද තීරණ නිශ්ඵල වීම.**

VIII. **ඇතැම් ප්‍රඥප්ති කෙටුම්පත් අවසන් පරීක්ෂාවකින් පසු නැවත පරීක්ෂා කිරීමකින් තොරව ඉදිරිපත් කරනු ලබන හෙයින් දෝෂයන් සහිතව ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමට සිදු වීම.**

IX. **පළාත් සභාවේ සම්මත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට පෙර සභාවට ඉදිරිපත් කිරීම සඳහා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව නිර්දේශය ලබා නොගැනීම.**

X. **සභාවට ඉදිරිපත් කිරීම සඳහා අදාළ පටපත් ප්‍රමාණයන් සහිතව හා තෛභාෂා වලින් ලබා නොදීම හේතුවෙන් ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාදයන් ඇති වීම.**

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ආයතන මට්ටමින් තව දුරටත් අවධානය යොමු කළ යුතු විශේෂ ක්ෂේත්‍ර සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීම.

# ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

## අධ්‍යාපන ක්ෂේත්‍රය :-

- පාසල් යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තු කිරීම
- පාසල් ගොඩනැගිලි භාවිතා කිරීම.
- ජල පහසුකම් ලබා දීම.
- ගුරු හිඟ වැටුප් හා වැටුප් වර්ධක ගෙවීමේදී කලාප අධ්‍යාපන කාර්යභාරයන් තව දුරටත් විධිමත් කිරීම.

පළාතේ ඇතැම් පාසල්වල ළමා ඩෙස්, ළමා පුටු, විද්‍යාගාර උපකරණ අතිරික්තව පවතින අතර ඇතැම් පාසල්වල මේවායේ ඌණතාවයක් පවතී.

- උදා -


ඔ/ කටුගල්ල විද්‍යාලයේ ද්විතීයික අංශය ඉවත් කිරීමත් සමඟ එහි තිබූ විද්‍යාගාර උපකරණ, සංගීත උපකරණ, පරිගණක, ඩෙස් පුටු අතිරික්තව නිස්කාර්යව පවතී.

# නිස්කාර්යව පවතින විද්‍යාගාර උපකරණ














නිස්කාර්යව
පවතින
පරිගණක



# නිස්කාර්යව පවතින පුස්තකාල පොත්











# නිස්කාර්යව පවතින සංගීත උපකරණ














# මො/ හුලංදාව දකුණ මහ විදුහලෙහි ඩෙස් පුටු හා විද්‍යාගාර උපකරණ අවශ්‍ය ප්‍රමාණයට නොමැති තත්වයක් නිරීක්ෂණය විය.

- ඉහල පංතිවල සිසුන් ඉතා අපහසුවෙන් ළදරු මේසවල සිට අධ්‍යාපන කටයුතු සිදු කරමින් සිටින අයුරු






## ගෘහ විද්‍යා කාමරයේ ලියන මේසය, භාවිතයෙන් ඉවත් කරන ලද මේස ලෑල්ලක් භාවිතයෙන් තාවකාලිකව සකස් කොට ගෙන ඇති අයුරු





විද්‍යාගාරයේ පුටු හා උපකරණ ප්‍රමාණවත්ව නොතිබෙන අයුරු



පළාත් සභාවට අයත් පාසල් දෙකක විදුහල්පතිවරුන්ගේ එකඟතාවය හා කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය මත පාසල් අතර අතිරික්ත හා ඌණ පාසල් උපකරණ ලිඛිතව හා විධිමත් සටහන් සහිතව හුවමාරු කළ හැකි පරිදි මෙන්ම අවශ්‍ය අවස්ථාවල ආපසු ලබා ගත හැකි පරිදි කටයුතු කිරීමෙන් මෙවැනි ගැටළු මඟ හැරෙනු ඇති බව විගණනය නිරීක්ෂණය කරමි.

## පළාත් පාලන ක්ෂේත්‍රය :-

- හිඟ ආදායම් අය කර ගැනීම.

- බොහෝ ආයතන වල වෙළඳ සංකීර්ණ වල වසා දමා ඇති කඩ කාමර නිරීක්ෂණය වීම. ඒ සම්බන්ධ ආදායම් අය කර ගැනීමේ ගැටලු

  උදා :- හපුතලේ නගර සභාව
  පස්සර ප්‍රාදේශීය සභාව

- (ව්‍යාපෘති තෝරා ගැනීම, සාධ්‍යතා අධ්‍යයනය, කඩ කාමර තක්සේරු කිරීම් යන ක්‍රමවේදවල අඩුපාඩු පැවතීම.)

## ඉඩම් ක්ෂේත්‍රය :- හිඟ ඉඩම් බදු

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ වාර්ෂික බදු සහ දීර්ඝ කාලීන බදු අය කර ගැනීමේ දුර්වලතා.

උදා :-

- මහියංගණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

  **- රු. 9,203,969.00**

- වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

  **- රු. 4,303,562.00**

- කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

  **- රු. 5,988,427.00**

# ආදායම් ක්ෂේත්‍රය

- පළාත් සහා යටතේ පළාත් අරමුදල වෙනුවෙන් අයකරගත හැකි නව ආදායම් මාර්ග වෙනුවෙන් ප්‍රඥප්ති සකස් කර ඉදිරි කටයුතු කිරීමට අවධානය යොමු කිරීම සහ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ කාර්යභාරය වැඩිදියුණු කිරීම.

# උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

# ආයුර්වේද ක්ෂේත්‍රය

- ඖෂධ නිෂ්පාදනාගාරයේ කටයුතු වැඩිදියුණු කිරීම සහ දේශීය ඖෂධ වගා කිරීම සම්බන්ධව දෙපාර්තමේන්තුව සතු ඉඩම් නිසි පරිදි නඩත්තු කිරීම සහ පෞද්ගලිකව ගොවීන් ඒ සඳහා යොමු කරවා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## මිරිස්වත්ත ඖෂධ නිෂ්පාදනාගාරය (ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.)



ඖෂධ වියළීම සඳහා සකසා ගෙන ඇති ස්ථානය



ඖෂධ සේදීම සඳහා භාවිතා කරන ස්ථානය

# මිරිස්වත්ත ඖෂධ නිෂ්පාදනාගාරය (ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.)



බෝතල් සේදීම සඳහා භාවිතා කරන
එක් සේදීම් බුරුසුවක් පමණක්
ක්‍රියාකාරී තත්ත්වයේ ඇති අනාරක්ෂිත
විදුලි සැපයුමක් සහිත සේදුම් යන්ත්‍රය

අක්කර 10 ක පමණ භූමියේ
කොහොඹ ගස් පමණක් ඇති
අයුරු සහ කැලෑ වැවී ඇති අයුරු





# බඩල් කුඹුර ඖෂධ උයන



ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති නිසා ඖසු උයන සඳහා ජලය ලබා ගැනීමට අසල ඉඩමක සකසාගෙන ඇති අඩි දෙකක් පමණ ජලය පිරී ඇති ළිඳ

## විගණන යෝජනා

**01.** ඖෂධ නිෂ්පාදනාගාරය ස්ථාන ගත කර ඇති භූමිය තුළ අවශ්‍ය දේශීය ඖෂධ වගාකිරීමට ප්‍රමුඛත්වයක් ලබාදීම. (දැනට ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ කොහොඹ සහ ගම්මිරිස් වගාවන්ට පමණි.)

**02.** ඖෂධ නිෂ්පාදනාගාරයේ පහසුකම් වැඩිදියුණු කිරීම, වියලි ඖෂධ සේදීම සහ වියලා ගැනීම සහ තෙල් හිදීම් වැනි කටයුතු සඳහා අවශ්‍ය උපකරණ සැපයීම.

**03.** ඖෂධ නිෂ්පාදනාගාරයට ලබාදී ඇති නිෂ්පාදන ඉලක්ක වන්නේ ඒ ඒ ඖෂධ වර්ග වලින් 75% ප්‍රතිශතයකි. නමුත් නිෂ්පාදනය කල හැකි රෝගීන් වෙනුවෙන් අවශ්‍ය ඖෂධ 100% මට්ටම නිෂ්පාදනය කිරීමට හැකියාව පවතින බවට තොරතුරු අනාවරණය වන බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කිරිම.

**04.** දීර්ඝකාලීන පළාත් ඖෂධ අවශ්‍යතාවයෙන් 25% ප්‍රමාණයක් ආයුර්වේද සංස්ථාව මගින් මුදල් ගෙවා ලබාගනී. මේ සඳහා පසුගිය වර්ෂ 03 තුල වියදම හා ඉදිරි අපේක්ෂිත වියදම පහත පරිදිය.

| | |
|---|---|
| 2018 | රු. 23,000,000/- |
| 2019 | රු 24,000,000/- |
| 2020.08.31 | රු. 2,520,000/- |
| 2020 ඇස්තමේන්තුව | රු.30,000,000/- |

මෙම සැලකිය යුතු වියදම අවම කර ගැනීමට ඖෂධ නිෂ්පාදනාගාරයෙන් හැකි උපරිම නිෂ්පාදනයක් ලබාගැනීමට කටයුතු කිරීම සුදුසුවේ.

**05.** පළාතේ ඖෂධ නිෂ්පාදන සිදුකරන බඩල්කුඹුර ඖෂධ උයනේ ඖෂධ නිෂ්පාදන කටයුතු වැඩි දියුණු කිරීම

# <u>ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය</u>

# ගොවිපල සංවර්ධන කටයුතු සහ වෙනත් ගැටළු පිළිබඳ අවධානය

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ගොවිපළ කටයුතු තව දුරටත් සංවර්ධනය කිරීම මගින් පළාත් නිෂ්පාදනයට දායකත්වයක් සැපයීම.

**01.** බිඳුණුවැව ගොවිපලේ වගා නොකල ඉඩම් වගා කිරීමට පියවර ගැනීම.

**02.** පාසල් ඉඩම් සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තු සහාය ලබාදීම.

# බීජ ගොවිපළ හා පුහුණු මධ්‍යස්ථානය ඔක්කම්පිටිය

**03.** **වර්ෂ කිහිපයක සිට ඔක්කම්පිටිය බීජ ගොවිපලේ ගබඩා කර ඇති විනාශ වෙමින් පවතින පාරිභෝගික වී අලෙවි කිරීමට කඩිනම් වැඩ පිළිවෙලක් යෙදීම.**





**ගබඩාවේ විනාශ වෙමින් පවතින 2018/2019 මහ කන්නය හා 2019 යල කන්නයට අදාළ පාරිභෝගික වී**

**04. බිබිල, ඔක්කම්පිටිය යන ගොවිපලයන් තුල ඇති විවිධ පැළ වර්ග මහජනයා වෙත ලබාදීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම.**

**2018 වර්ෂයේ සිට අලෙවි කර නොමැති මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ව්‍යාපෘතියක් සඳහා සැකසූ බීජ දෙහි පැළ 8000 ක පමණ ප්‍රමාණයෙන් මේ දක්වා ඉතිරිවී ඇති දෙහි පැළ 3000 ක පමණ ප්‍රමාණය නිසි නඩත්තුවක් නොමැතිව ඇති අයුරු. (ඔක්කම්පිටිය බීජ ගොවිපල)**






දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය බිබිල



# කෘෂි උපදේශනය

**01.** කෘෂි උපදේශන කටයුතු වැඩිදියුණු කිරීම සහ ක්ෂේත්‍රයේ ගොවීන් සඳහා අවශ්‍ය උපදේශනය ලබාදීමේ වැඩසටහන් වර්ධනය කිරීම.

**02.** රසායනික පොහොර මෙන්ම කෘෂි රසායන භාවිතය අවම කිරීම, කාබනික පොහොර භාවිතය පිළිබඳව ගොවීන් යොමු කිරීම මෙන්ම එම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ගොවීන්ට ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි අවස්ථාවන් සලසා දීම.

# වාරිමාර්ග ක්ෂේත්‍රය

**01.** අදාළ ව්‍යාපෘතිය සම්පූර්ණ නොවීම හේතුවෙන් අදාළ අරමුණු ඉටු කර ගැනීම මෙන්ම ප්‍රතිලාභ ලබා ගැනීම ගැටලු සහගත වී ඇති ව්‍යාපෘතීන් පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම.


**02. ව්‍යාපෘතියේ අංශ සියල්ල නිම නොකිරීම මත අපේක්ෂිත ප්‍රතිලාභ ඉටු කර ගැනීමට නොහැකි වී ඇති අවස්ථා පවතිනු නිරීක්ෂණය විය.**

**උදා-**

**රත්මල්කැටිය දමන්පිටිය අමුණ හා ඇල ප්‍රතිසංස්කරණය කිරීම**




රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රු. 2,000,000.00 ක පමණ මුදලක් වියදම් කොට 2019 වර්ෂයේ ඉදි කොට ඇති අතර මෙම වාරි කර්මාන්තයට අදාළ සාධ්‍යතා අධ්‍යන වාර්තාවට අනුව ගොවි පවුල් 12 කට අයත් කුඹුරු අක්කර 10 යි රූඩ් 03 ක් වී වගාව, බඩ ඉරිගු හා අතිරේක බෝග වගාව වෙනුවෙන් යොදා ගැනීමට අපේක්ෂා කරන බව සදහන් කොට තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතියට අයත් ජල පොම්පාගාරය හා ජල ගබඩා ටැංකිය අතර නල පද්ධතිය සම්බන්ධ කොට නොතිබීම මත වගා නොකරන තත්ත්වයක් ක්ෂේත්‍ර විගණනයේදී නිරීක්ෂණය විය.

වගා කළ හැකි බිම් වගා නොකොට පවතින අයුරු

## විගණන යෝජනා

- ඌව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් යම් වාරි කර්මාන්තයක් නිම කළ පසු එහි වාරි ජලය යොදා ගෙන නව වගාවන් සිදු කරවීමේ වගකීම ඌව පළාත් කෘෂි කර්ම දෙපාර්තමේන්තුව වෙත පැවරෙන අයුරින් ප්‍රතිපත්ති සකස් විය යුතුය.

# උඩවළව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශය

- **2012** වර්ෂයේ ආරම්භ වී ඇති වෙල්ලස්ස සහල් සැකසුම් මධ්‍යස්ථානය සඳහා දරා ඇති වියදම රු.**7,776,946.94** කි. මෙය මේ වන විට නිෂ්කාර්යව පවතින තත්ත්වයක් සේම නිසි නඩත්තුවක් නොමැතිකමින් විනාශ වෙමින් පවතින තත්ත්වයක් ක්ෂේත්‍ර විගණන කටයුතු වලදී නිරික්ෂණය විය.

මෙම මධ්‍යස්ථානය සමුපකාර දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන ගොස් ඇති අතර **2015** වර්ෂයේදී සිට සී/ස මොණරාගල කඳුකර විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ඉදිරි කටයුතු පවත්වා ගෙන යාමට පවරා දී ඇත. අදාල සමිතිය විසින්ද මෙහි නඩත්තු කටයුතු වෙනුවෙන් රු. **50,000,000/-**කට ආසන්න මුදලක් වියදම් කර ඇත. නමුත් මේ වන විට එහි කටයුතු සිදු නොවන මට්ටමක් නිරීක්ෂණය වන අතර මෙය සමුපකාර දෙපාර්තමේන්තුව සතු වත්කමක් බැවින් මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කළ යුතුය.




# වෙල්ලස්ස සහල් සැකසුම් මධ්‍යස්ථානය









# වෙල්ලස්ස සහල් සැකසුම් මධ්‍යස්ථානය





# **ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය**

# ප්‍රවාහන ක්ෂේත්‍රය

- මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා අධිකාරියේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය ශක්තිය වැඩි දියුණු කිරීමට පියවර ගැනීම.

<u>මූල්‍ය පරිපාලනය.</u>

ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති වීම මත ප්‍රවාහන අධිකාරියේ මාසික වියදම වන රු. **5,748,700.00** ක වියදම් පියවා ගැනීම සඳහා ගැටළු සහගත තත්ත්වයක් විගණනයේදී නිරීක්ෂණය විය. පසුගිය කාල සීමාවන් වල විටින් විට අවස්ථා කිහිපයකදී වෙන් වෙන් දිනවල වැටුප් ගෙවීම් නිරීක්ෂණය වන අතර අධිකාරිය වෙත නියමිත පරිදි ලැබිය යුතු ලැබීම් නිසි පරිදි නොලැබෙන තත්ත්වයක් විගණනයේදී හෙලිදරවු විය.

## I. නව මාර්ග බලපත්‍ර ලබාදීම හා මාර්ග බලපත්‍ර අළුත් කිරීම. (Root permit)

ලියාපදිංචි බස් රථ සංඛ්‍යාව **1217** ක් වුවද ධාවනයේ යෙදෙන බස්රථ වාර්ෂිකව නව බලපත්‍රය අළුත් කරවා ගැනීමේදී ප්‍රමාදයන් පැවතීම, අළුත් කරවා නොගෙන ධාවනය කිරීම, විවිධ හේතු මත මාර්ග බලපත්‍රයන් ලබා ගැනීමේ ගැටළු සහගත තත්ත්වයක් විගණනයට නිරීක්ෂණය විය. වර්තමාන තත්ත්වයන් පහත පරිදිය.

| කලාපය | ලියාපදිංචි බස්රථ ප්‍රමාණය | වාර්ෂික මාර්ග බලපත්‍ර අළුත් කළ ප්‍රමාණය | තවදුරටත් වලංගු බලපත්‍ර ප්‍රමාණය | අළුත් නොකර ධාවනය වන ප්‍රමාණය |
|---|---|---|---|---|
| බදුල්ල | **187** | **121** | **44** | **22** |
| මහියංගණය | **220** | **169** | **38** | **13** |
| මොණරාගල | **256** | **117** | **93** | **46** |
| බණ්ඩාරවෙල | **196** | **134** | **40** | **22** |
| වැලිමඩ | **178** | **134** | **30** | **14** |
| අවලංගු කළ හා ධාවනය නොවන බස් රථ | **180** | | | |
| එකතුව | **1217** | **675** | **245** | **117** |

## II. හිඟ ආදායම්.

පසුගිය වර්ෂ වලදී අධිකාරියට අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව විධිමත් වැඩ පිලිවෙලක අවශ්‍යතාවයක් ඇති බව වර්තමානයේ නිරීක්ෂණය විය. ප්‍රවාහන අධිකාරියේ ආදායම් මාර්ග කිහිපයක හිඟ ආදායම් පහත පරිදිය.

| | |
|---|---|
| හිඟ මාර්ග බලපත්‍ර ගාස්තු | - රු. 2,133,500.00 |
| හිඟ ලොග් පත්‍ර ගාස්තු | - රු. 1,849,000.00 |
| හිඟ රියදුරු, කොන්දොස්තර බලපත්‍ර | - රු. 1,189,500.00 |
| | රු. 5,162,000.00 |

ඉහත හිඟය මුදල් පදනම මත ගිණුම් තැබීම නිසා මූල්‍ය වාර්තා වලින් ඉවත් වී ඇත.

# ප්‍රාදේශීය කාර්යාල වෙත බලතල පවරා දී ඇති පළාත් සභා කාර්යයන් සම්බන්ධව සමාලෝචන කටයුතු කිරීම. (2020.09.03 දිනැති ලිපිය)

ඌව අභියෝගයෙන් අභිමානයට

**ඌව පළාත් සභාව**

ஊவா மாகாண சபை

**UVA PROVINCIAL COUNCIL**

ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය

ஊவா மாகாண பிரதான செயலாளர் அலுவலகம்

OFFICE OF THE CHIEF SECRETARY, UVA PROVINCE

රජ වීදිය, බදුල්ල. ஜோகுதி-இராஜ வீதி, பதுளை King's Street, Badulla

" විශිෂ්ඨතම ජනතා හිතවාදී පරිපාලනයක් "

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

26 AUG 2020

(39)

මගේ අංකය / எனது இல / My No. 4/P/ACC/06

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2020.08. 24

ඌව පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

ඌව පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ආයතන ප්‍රධානීන්,

**විගණන හා කළමනාකරණ කමිටු.**

උක්ත කරුණ සම්බන්ධයෙන් සහකාර විගණකාධිපතිගේ යූවීපී/බීඩී/බී16 හා 2020 අගෝස්තු 13 දිනැති ලිපිය හා බැදේ. ( අදාල ලිපිය අමුණා ඇත)

එමගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉටු කරන ඌව පළාත් සභාවේ කාර්යයන් විගණන කමිටුවේදී සමාලෝචනය නොවන බව දන්වා ඇත.

ඔබ ආයතනය මගින් ප්‍රාදේශීය ලේකම් වෙත බලතල පවරා ඉටු කර ගනු ලබන කාර්යයන් පිළිබඳ ඔබ ආයතනය මගින් අදාල නිලධාරීන් ගෙන්වා නිශ්චිත කාලයකට වරක් පසු විපරම කරන බව මාද දන්නා කරුණකි.

කෙසේ වෙතත් සහකාර විගණකාධිපතිගේ ලිපියේ ඇති පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටු කරන පළාත් සභා කාර්යයන් විගණන කමිටුවේදී සාකච්ඡා කිරීම සඳහා වැඩ පිළිවෙලක් සැකසිය යුතුව ඇත.

එබැවින් ඔබ ආයතනය විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත බලතල පවරා ඉටුකර ගනු ලබන කාර්යයන් සැලසුම් කිරීම, ඇගයීම හා නියාමනය සිදු කරන ආකාරය පිළිබඳ කරුණු ඇතුලත් වාර්තාවක් මාවෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

පී.බී. විජයරත්න

ඌව පළාතේ ප්‍රධාන ලේකම්

පිටපත :- සහකාර විගණකාධිපති - කරු. දැ.ගැ.ස


ප්‍රධාන ලේකම් / செயலாளர் / Chief Secretary 055-2222809
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / பிரதி பிரதான செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Admin) 055-2222203
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary 055-2222899
ෆැක්ස් / தொலைநகல் / Fax 055-2231670
ෆැක්ස් / தொலைநகல் / Fax 055-2223977
ගණකාධිකාරී / கணக்காளர் / Accountant 055-2229425
පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer 055-2229426
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephones 055-2222804 055-2222810 055-2222818 055-2222712


---

19 AUG 2020

13 AUG 2020

053134

19 AUG 2020

මගේ අංකය: යූවීපී/බීඩී/බී/16
රජයේ විගණන උපකාර්යාලය
ඌව පළාත් සභාව
බදුල්ල.

2020 අගෝස්තු 13 දින.

ප්‍රධාන ලේකම්
ඌව පළාත.

**විගණන හා කළමනාකරණ කමිටු**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාව හා ඌව පළාත් සභාව යටතේ පවත්නා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විගණන හා කළමනාකරණ කමිටු පත්කර ගෙන ඇත.

02. 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනතේ 3(2)වගන්තිය අනුව ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් පළාත් සභාවක කාර්යයන් තම කොට්ඨාශය ඇතුළත ක්‍රියාත්මක කළ යුතුය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් විශේෂයෙන් සමාලෝචනය කළයුතු බව සඳහන් වන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1)(අ)(ආ) වගන්ති වල සඳහන් කරුණු පරීක්ෂා කිරීම සඳහා ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉටු කරනු ලබන ඌව පළාත් සභාවේ කාර්යයන් එමගින් සමාලෝචනයට භාජනය නොවන බව නිරීක්ෂණය වේ.

03. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉටුකරන කාර්යයන් විගණන හා කළමනාකරණ කමිටුවේදී සමාලෝචනයට භාජනය වීම පිණිස වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනමෙන් කාරුණිකව ඉල්ලමි.

බී.ජී.අසේල ඉඳුනිල්
විගණන අධිකාරී
B. G. A. Indunil
Superintendent of Audit
විගණකාධිපති වෙනුවට.

පිටපත් :-
1. ලේකම්, ඌව ආණ්ඩුකාරවර කාර්යාලය.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව.

මේ අනුව මෙම කරුණු ඉදිරිපත් කිරීම ඉදිරිපත් කල විගණන වාර්තා සහ ක්ෂේත්‍ර විගණන පරීක්ෂණ මත පදනම් වූ බැවින් විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාවලියේ මෙන්ම අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ යම් සංශෝධන හෝ වැඩිදියුණු කිරීම් සඳහා ඔබ සියලු දෙනාගේ අදහස් ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර මෙම සාකච්ඡාව සඳහා විවෘතව සක්‍රීයව සම්බන්ධ වන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි. එසේම අද දින පළාත් අරමුදල් පිළිබඳ කමිටුව සඳහා සංග්‍රහ කටයුතු සිදු කරනු ලබන්නේ ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සුභ සාධක සංගමය විසිනි. එම සංග්‍රහයද භුක්ති විදින ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

# ස්තූතියි..!